# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2397/30 - 2024 අගෝස්තු මස 14 වැනි බදාදා - 2024.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත**

1996 අංක 27 සහ 2024 අංක 39 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත් මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (7) වගන්තිය සමග කියවිය යුතු 71 (1) වගන්තිය යටතේ තාක්ෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති,
තාක්ෂණ අමාත්‍ය.

කොළඹ දී ය.
2024 අගෝස්තු 06 වැනි දින

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි 2024 අංක 02 දරන **ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය වෙන්දේසි කිරීමේ රෙගුලාසි** යනුවෙන් හැඳින්වේ.

2. මෙම රෙගුලාසි 2024 අගෝස්තු 06 වැනි දින සිට බලපැවැත්වේ.

3. පුළුල් පරාස දත්ත සේවා (broadband services) සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ මෙම රෙගුලාසි ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වෙන්දේසිය පැවැත්විය යුතුය.

4. කොමිෂන් සභාව විසින් තරඟකාරී වෙන්දේසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ අරමුණ වන්නේ;

   4.1 විනිවිදභාවය සහ සාධාරණව ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ රාමුවක් සහතික කිරීම.

   4.2 ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කිරීමෙහි ලා තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සහ ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියට ප්‍රවේශ වීමෙහි ලා පහසුකම් සැලසීම.

   4.3 වෙළඳපල ඉල්ලුම මත පදනම්ව ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ ආර්ථික වටිනාකම තීරණය කිරීම සඳහා විනිවිදභාවය, සාධාරණ, තරඟකාරී සහ විෂමතාවයන්ගෙන් තොර මිලකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

1A - PG 6825 — 29 (2025/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවියේ දැන්වීමක් පළ කළ යුතුය: -

   5.1. වෙන්දේසි කිරීමට නියමිත සංඛ්‍යාත වර්ණාවලියේ කොටස් විස්තර කිරීම; සහ

   5.2. වෙන්දේසිය පවත්වන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ලබා දීම; සහ

   5.3. වෙන්දේසියට සහභාගී වීම පිණිස කොමිෂන් සභාව වෙත අයදුම් කිරීමට මහජනතාවට ආරාධනා කිරීම; සහ

   5.4. අයදුම්පත් සඳහා අවසන් දිනය සහ වේලාව සඳහන් කිරීම; සහ

   5.5. මෙම රෙගුලාසි ප්‍රකාරව පැවරුම සිදු කරන බව ප්‍රකාශ කිරීම; සහ

   5.6. අයදුම්පත්‍රයේ තොරතුරු, නිවේදනයේ දක්වා ඇති ලිපිනයේ පිහිටි කොමිෂන් සභාවෙන් ලබා ගත හැකි බව හෝ සබැඳියෙන් බාගත කළ හැකි බව ප්‍රකාශ කිරීම .

6. කොමිෂන් සභාව විසින් එක් එක් වෙන්දේසිය සඳහා සංඛ්‍යාත පැවරුම් නිවේදනය (NoA) ප්‍රකාශයට පත් කළ යුතුය. ඒ සඳහා යෝග්‍ය සුදුසුකම් ලත් පුද්ගලයන්, වෙන්දේසි ආකෘතිය, කොන්දේසි, පැවරුම් කාලය, ක්‍රියා පටිපාටි සහ ලංසුකරුවන් සහභාගී විය යුතු ආකාරය පිළිබඳ දැක්වෙන උපදෙස් මෙහි අඩංගු කළ යුතු අතර ඒවාට සීමා නොවිය යුතුය.

7. වෙන්දේසියට සහභාගී වීමට අවසර දෙනු ලබන්නේ ලියාපදිංචි ලංසුකරුවන්ට පමණි. එක් වෙන්දේසියක් සඳහා රුපියල් 100,000/- ඇතුල්වීමේ ගාස්තුවක් ගෙවා සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ලියාපදිංචි විය හැකිය.

8. එක් එක් වෙන්දේසියට අදාළ සංඛ්‍යාත පැවරුම් නිවේදනයේ (NoA) දක්වා ඇති පරිදි නිශ්චිත කාල සීමාවක් සඳහා සංඛ්‍යාත වර්ණාවලි කොටස් ජයග්‍රාහී ලංසුකරු වෙත පැවරිය යුතුය.

9. ජයග්‍රාහී ලංසුකරු විසින් වෙන්දේසිය අවසන් වන විට ජයග්‍රාහී ලංසු මිලෙන් 10%ක් තැන්පත් කළ යුතු අතර ඉතිරි ලංසු මිල කොමිෂන් සභාව විසින් නිශ්චය කරන ලද සැලැස්මකට අනුව ගෙවිය යුතුය.

10. නියමිත කාල සීමාව තුළ එම මුදල නොගෙවන්නේ නම්, ජයග්‍රාහී ලංසුකරුට එම සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා පවත්නා සියලුම හිමිකම් අහෝසි වේ. කොමිෂන් සභාව විසින් එවැනි සංඛ්‍යාත වර්ණාවලි කොටස් නව පැවරුම් සඳහා ලබා දෙනු ඇත.

11. ජයග්‍රාහී ලංසුකරු විසින් ලංසු මිලට අමතරව සියලුම රජයේ බදු ගෙවිය යුතුය.

12. කොමිෂන් සභාව විසින් එක් එක් සංඛ්‍යාත වර්ණාවලි කොටසක් සඳහා සංචිත මිල තීරණය කළ යුතු අතර ඒ බව සංඛ්‍යාත පැවරුම් නිවේදනයේ සඳහන් කළ යුතුය.

13. කොමිෂන් සභාව විසින් එක් එක් ලියාපදිංචි ලංසුකරු සඳහා හඳුනාගැනීමේ සලකුණක් නිකුත් කළ යුතුය.

14. ජයග්‍රාහී ලංසුකරුට ජයග්‍රාහී ලංසු මුදල ගෙවීමට අමතරව අයදුම් කරන අවස්ථාවේ බලපවත්වන නීති හෝ රෙගුලාසි වලට අනුකූලව ගාස්තු ගෙවා පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාරව සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

15. නියමිත පරිදි ගාස්තු නොගෙවීම මත එම සංඛ්‍යාත වර්ණාවලි කොටස් නව පැවරුම් සඳහා වෙන්දේසි කිරීමේ අයිතිය කොමිෂන් සභාව සතුවේ.

16. වෙන්දේසිකරු යනුවෙන් අදහස් වන්නේ වෙන්දේසිය පැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් පත් කරන ලද තැනැත්තකු හෝ කමිටුවක් වේ.

17. වෙන්දේසිකරු: -

   (අ) එක් එක් සංඛ්‍යාත වර්ණාවලි කොටස සඳහා ලංසු කැඳවීම.
   (ආ) සංඛ්‍යාත වර්ණාවලි කොටස සඳහා වැඩිම ලංසුව ඉදිරිපත් කරන ලියාපදිංචි ලංසුකරු හඳුනා ගැනීම.

   ආරාවුල් සහිත ලංසුවකදී:

   (අ) වෙන්දේසිකරු එකම බේරුම්කරු වේ; සහ
   (ආ) වෙන්දේසිකරුගේ තීරණය අවසාන තීරණයවේ.

18. සාධනීය ලංසුකරුවන් සංඛ්‍යාව, තරඟකාරිත්වයේ මට්ටම, වෙළඳපල පළපුරුද්ද සහ සංඛ්‍යාත වර්ණාවලිය ලබාගත හැකි බව සැලකිල්ලට ගනිමින් සංඛ්‍යාත කොටස් සඳහා පහත දැක්වෙන සුදුසු වෙන්දේසි ආකෘති කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලැබේ. සංඛ්‍යාත පැවරීමේ නිවේදනය (NoA) කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කළ යුතුය.

**වෙන්දේසි ආකෘති ;**

18.1 තනි-වටයේ මුද්‍රා තැබූ-ලංසු **වෙන්දේසි (සාමාන්‍ය)**

18.1.1 තනි වටයේ වෙන්දේසි මගින් ලංසුකරුවන්ට ඔවුන් අපේක්ෂා කරන සංඛ්‍යාත වර්ණාවලිය සඳහා අභිලාශය ප්‍රකාශ කිරීමට එක් අවස්ථාවක් පමණක් ලබා දේ.

18.1.2 වෙන්දේසිකරු විසින් පිරිනැමෙන එක් එක් සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා සංචිත මිලගණන් සංඛ්‍යාත පැවරුම් නිවේදනයේ (NoA) පරිදි ප්‍රකාශ කළ යුතුය.

18.1.3 වෙන්දේසිකරු විසින් ලංසුකරුවන්ට නියමිත කාල සීමාව තුළ තම ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදිය යුතුය.

18.1.4 ලංසුකරු විසින් සංඛ්‍යාත වර්ණාවලියේ විවිධ කොටස් සඳහා ඔහුගේ/ඇයගේ ලංසු ලියවිලි නියමිත කාල සීමාව තුළ, මුද්‍රාතැබූ ලියුම් කවරයක බහා වෙන්දේසිකරුට භාර දිය යුතු අතර නොඑසේනම් සෙසු ලංසුකරුවන්ට ප්‍රදර්ශනය නොවන සේ ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. ලංසුකරුවෙකු අභිලාශයක් නොදක්වන සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා ශූන්‍ය ලංසු අගයක් ලිවිය යුතුය.

18.1.5 ලංසු ඉදිරිපත් කළ පසු එම ලංසු ඉවත් කර ගැනීමට හෝ වෙනස් කිරීමට අවසර නොලැබේ.

18.1.6 ලංසු තැබීම සඳහා නියමිත කාල සීමාව අවසන් වූ විට, වෙන්දේසිකරු විසින් ප්‍රතිඵල ඇගයීමට ලක් කළ යුතුය.

18.1.7 සංඛ්‍යාත වර්ණාවලි කොටස සඳහා ඉදිරිපත් කරන ඉහළම ලංසුව එම කොටස දිනා ගන්නා අතර, ජයග්‍රාහී ලංසුකරු විසින් එම කොටස සඳහා ඔහු/ඇය විසින් ඉදිරිපත් කරන ලද ලංසු වටිනාකම ගෙවිය යුතුය.

18.1.8 ලංසුකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් සංඛ්‍යාත වර්ණාවලි කොටස සඳහා එක හා සමාන මිල (සර්වසම) ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී එය ලංසු ලොතරැයියක් ඇදීමෙන් නිරාකරණය කරනු ලැබේ.

18.2 තනි-වටයේ මුද්‍රා තැබූ-ලංසු වෙන්දේසි - (SRSB) - මුද්‍රා තැබූ ලංසු දෙවැනි මිල නියම කොටගත් වෙන්දේසිය (Vickery **Auction)**

18.2.1 මෙම වෙන්දේසියේ දී තනි වටයේ මුද්‍රා තැබූ ලංසුවක් සහිත දෙවන මිල සැලකිල්ලට ගනු ලැබේ.

18.2.2 වෙන්දේසිකරු විසින් පිරිනැමෙන එක් එක් සංඛ්‍යාත වර්ණාවලිය සඳහා සංචිත මිල සංඛ්‍යාත පිරිනැමීමේ නිවේදනයට (NoA) අනුව ප්‍රකාශ කළ යුතුය.

18.2.3 වෙන්දේසිකරු විසින් ලංසුකරුවන්ට නියමිත කාල සීමාව තුළ සිය ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

18.2.4 ලංසුකරු විසින් වර්ණාවලියේ විවිධ කොටස් සඳහා ඔහුගේ/ඇයගේ ලංසු ලියවිලි නියමිත කාල සීමාව තුළ, මුද්‍රාතැබූ ලියුම් කවරයක බහා වෙන්දේසිකරුට භාර දිය යුතු අතර නොඑසේනම් සෙසු ලංසුකරුවන්ට ප්‍රදර්ශනය නොවන සේ ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් ඔස්සේ ඉදිරිපත් කළ යුතු වේ. ලංසුකරුවෙකු අභිලාශය නොදක්වන සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා ශූන්‍ය ලංසු අගයක් ලිවිය යුතුය.

18.2.5 ලංසු ඉදිරිපත් කළ පසු එම ලංසු ඉවත් කර ගැනීමට හෝ වෙනස් කිරීමට අවසර නොලැබේ.

18.2.6 ලංසු තැබීම සඳහා නියමිත කාල සීමාව අවසන් වූ විට, වෙන්දේසිකරු විසින් ප්‍රතිඵල ඇගයීමට ලක් කළ යුතුය.

18.2.7 සංඛ්‍යාත කොටස සඳහා ඉදිරිපත් කරන ඉහළම ලංසුව එම කොටස දිනා ගන්නා අතර, ජයග්‍රාහී ලංසුකරු එම කොටස සඳහා ලැබුණු දෙවන ඉහළම ලංසුව ගෙවිය යුතුය. දෙවන ඉහළම ලංසුවක් නොමැති නම්, ජයග්‍රාහී ලංසු මුදල ගෙවිය යුතුය.

18.2.8 සමානතා, එනම් ලංසුකරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් ඉදිරිපත් කරන එක හා සමාන ලංසු මිලගණන්, ලොතරැයියක් ඇදීමෙන් නිරාකරණය කරනු ලැබේ.

18.3 සමගාමී වට කිහිපයක් සහිත වෙන්දේසි (SMRA)

18.3.1 වෙන්දේසිකරු විසින් සංඛ්‍යාත වර්ණාවලියේ පිරිනැමෙන එක් එක් කොටස සඳහා සංචිත මිලගණන් සංඛ්‍යාත පැවරුම් නිවේදනයේ (NoA) සඳහන් ආකාරයට නිවේදනය කළ යුතු අතර එමෙන්ම ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් මගින් ප්‍රදර්ශනය කළ යුතුය.

18.3.2 පළමු වටයේ දී, ලංසුකරුවෙකු විසින් විවිධ සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා ඔහුගේ/ඇයගේ මුල් ලංසුවට අදාළ ලංසු ලියවිල්ල, වෙන්දේසිකරු විසින් ප්‍රකාශයට පත් කරන ලද නියමිත කාල සීමාවක් තුළ, මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා හෝ එම ලංසු සෙසු ලංසුකරුවන්ට ප්‍රදර්ශනය නොවන සේ ඉලෙක්ට්‍රොනික ලංසු තැබීමේ පද්ධතියක් ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. ලංසුකරුවෙකු අභිලාශය නොදක්වන සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා ශුන්‍ය අගයක් ලිවිය යුතුය.

18.3.3 ලංසු ඉදිරිපත් කළ පසු එම ලංසු ඉවත් කර ගැනීමට හෝ වෙනස් කිරීමට අවසර නොලැබේ.

18.3.4 පළමු වෙන්දේසි වටය අවසානයේදී, එක් එක් සංඛ්‍යාත වර්ණාවලි කොටස සඳහා අදාල ඉහළම ලංසු මුදල සියලුම ලංසුකරුවන්ට අනාවරණය කළ යුතුය.

18.3.5. වෙන්දේසිකරු විසින් ප්‍රකාශයට පත් කරන ලද කාල සීමාවකට පසුව, ලංසුකරුවන් මීළඟ වෙන්දේසි වටය සඳහා ඔවුන්ගේ උපාය මාර්ග සැලසුම් කළ යුතු අතර, දෙවන වෙන්දේසි වටය විවෘත කර පළමු වටයේ ආකාරයටම පවත්වනු ලැබේ.

18.3.6 ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ එක් එක් වෙන්දේසි වටයෙන් පසු ඔවුන් ගත යුතු තීරණවල සංකීර්ණත්වය මත පදනම්ව, වෙන්දේසි වටවල කාලසීමාවන් සහ විරාමයන් වෙනස් විය යුතුය.

18.3.7 එක් වෙන්දේසි වටයක ලංසු ඉදිරිපත්ව නොමැති අවස්ථාවක දී වෙන්දේසිය අවසන් කළ යුතුය. පෙර වටයේ ඉහළම ලංසුව අදාළ සංඛ්‍යාත වර්ණාවලි කොටස දිනා ගන්නා අතර ජයග්‍රාහී ලංසු මුදල ගෙවිය යුතුය.

18.3.8 එමෙන්ම එක් වෙන්දේසි වටයක දී ඉහළ මිලක් සහිත තනි ලංසුවක් ඇති අවස්ථාවක දී ද වෙන්දේසිය ද අවසන් කළ යුතුය. එවැනි අවස්ථාවක අදාළ සංඛ්‍යාත වර්ණාවලි කොටස දිනා ගන්නා අතර ලංසු මුදල ගෙවිය යුතුය.

18.3.9 වෙන්දේසි ක්‍රියාවලිය කඩිනම් කිරීම පිණිස, වෙන්දේසිකරු විසින් වෙන්දේසියේ ප්‍රගතිය මත පදනම්ව, පෙර වටයේ ඉහළම ලංසු වලින් 1% සිට 15% දක්වා පරාසයක් තුල අවම ලංසු වර්ධකයන් වෙන්දේසි වටයෙන් වටයට පැනවිය යුතුය.

18.4 වෙන්දේසිකරු විසින් මිල ගණන් ප්‍රකාශයට පත් කරන සීමිත පුනරාවර්තන වෙන්දේසි ක්‍රියාපටිපාටිය. (කාලධාරිත වෙන්දේසි) - Clock Auctions – (CA)

18.4.1 පළමු වටයේ දී, එක් සංඛ්‍යාත වර්ණාවලි කොටසක සංචිත මිල වෙන්දේසිකරු විසින් පෙන්විය යුතුය. (කාලධාරිත මිල - Clock price)

18.4.2 වෙන්දේසිකරු විසින් ප්‍රකාශයට පත් කරන ලද නියමිත කාල සීමාවක් තුළ ලංසුකරුවන් විසින් මෙම මිලට කොපමණ සංඛ්‍යාත වර්ණාවලි කොටස් ප්‍රමාණයක් මිලදී ගන්නේද යන්න දැක්වෙන ලංසු ලියවිල්ල මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා වෙන්දේසිකරුට භාර දීම හෝ නොඑසේනම් ලංසුකරුගේ ප්‍රකාශිත ඉල්ලුම සෙසු ලංසුකරුවන්ට ප්‍රදර්ශනය නොවන සේ විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියක් ඔස්සේ සඳහන් කිරීම කළ යුතුය.

18.4.3 ලංසුකරුවෙකු වෙන්දේසියෙන් ඉවත් වන බව සඳහන් කිරීම සඳහා ශුන්‍ය ලෙස සටහන් කර ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. එවැනි ලංසුකරුවෙකු පසු වෙන්දේසි වටවල ලංසු තැබීමට සුදුසුකම් නොලබයි.

18.4.4 පළමු වටයේ දී, ලංසුකරුවන් විසින් ඔවුන්ට අවශ්‍ය අවම සංඛ්‍යාත වර්ණාවලි කොටස් ගණන එනම් ඔවුන්ගේ අවම සංඛ්‍යාත වර්ණාවලි අවශ්‍යතාවය (MSR) ද සඳහන් කළ යුතුය.

18.4.5 මෙමගින් වෙන්දේසිකරු විසින් කාලධාරිත වෙන්දේසි අදියර අවසානයේ දී, ජයග්‍රාහී ලංසුකරුවන් අතර සංඛ්‍යාත වර්ණාවලි කොටස් බෙදා හරින විට ප්‍රමාණවත් නොවන බව සලකන සංඛ්‍යාත වර්ණාවලි කොටස් ප්‍රමාණයක්, ලංසුකරුවන් දිනා නොගන්නා බව සහතික කෙරේ.

18.4.6 පළමු වටය අවසානයේ දී වෙන්දේසිකරු විසින් තනි ලංසු අනාවරණය නොකර, සමස්ත ඉල්ලුම පවතින සැපයුම ඉක්මවන්නේද නැද්ද යන්න වාචිකව හෝ ඉලෙක්ට්‍රොනිකව දැනුම් දිය යුතුය.

18.4.7 සමස්ත ඉල්ලුම පවතින සැපයුමට සමාන නම් හෝ අඩු නම්, මෙය කාලධාරිත වෙන්දේසි අදියරේ අවසානය වන අතර, ලංසුකරුවන්ට ඔවුන්ගේ ප්‍රකාශිත ඉල්ලුමට අනුව සංඛ්‍යාත වර්ණාවලිකොටස් ප්‍රමාණ පැවරිය යුතුය.

18.4.7.1 සමස්ත ඉල්ලුම පවතින සැපයුමට වඩා වැඩි නම්, ඉහළ කාලධාරිත මිලක් (clock price) සහිත තවත් වටයක් අනුගමනය කළ යුතුය.

18.4.7.2 ප්‍රකාශිත සංචිත මිලට සමස්ත ඉල්ලුම වටයෙන් වටයට වෙන්දේසියේ ප්‍රගතිය අනුව අනුක්‍රමික මිල වර්ධක 5% සිට 15% දක්වා පරාසයක සාමාන්‍යයෙන් වෙනස් වේ. පවතින සැපයුමට වඩා වැඩි නම්, දෙවන වටය සඳහා අනුක්‍රමික මිල වැඩි කරනු ලැබේ. ලංසුකරුවන්ට ඊළඟ වටය සඳහා ඔවුන්ගේ උපාය මාර්ගය සැලසුම් කිරීමට වෙන්දේසිකරු විසින් කාලසීමාවක් ලබාදෙන අතර, වෙන්දේසිකරු විසින් ප්‍රකාශයට පත් කරන ලද කාල සීමාවෙන් පසුව දෙවන වටය විවෘත කරනු ලැබේ.

18.4.7.3 දෙවන වටයේ දී, නියමිත කාල සීමාවක් තුළ ඔවුන්ගේ ඉල්ලුම (නව අනුක්‍රමික මිලට ඔවුන් මිලදී ගන්නා සංඛ්‍යාත වර්ණාවලි කොටස් ගණන) ප්‍රකාශ කිරීමට ලංසුකරුවන්ට නැවත ආරාධනා කරනු ලැබේ. ඔවුන් පළමු වටයේ ඇති ඉල්ලුම ම හෝ ඊට අඩුවෙන් ප්‍රකාශ කළ යුතුය, නැතහොත් ඔවුන් ඉල්ලුම වැඩි කළ යුතුය.

18.4.7.4 දෙවන වටයේ සහ පසු වට වලදී, "අන්තර්-වට ලංසු තැබීමට" අවසර දෙනු ලැබේ. එයින් අදහස් වන්නේ ලංසුකරුවන් වත්මන් අනුක්‍රමික මිලට පමණක් නොව, වත්මන් සහ අවසාන අනුක්‍රමික මිල අතර ඕනෑම මිලකට ඉල්ලුම ප්‍රකාශ කළ යුතු බවයි. කෙසේ වෙතත්, ඔවුන් මීළඟ වටයේ ලංසු තැබීමට සුදුසුකම් ලැබීමට වත්මන් අනුක්‍රමික මිලට ඉල්ලුම ප්‍රකාශ කළ යුතුය.

18.4.7.5 ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ එක් එක් වටයෙන් පසු ඔවුන් ගත යුතු තීරණවල සංකීර්ණත්වය අනුව වෙන්දේසි වටවල කාලසීමාව සහ ඒවා අතර විරාමයන් වෙනස් විය හැකිය.

18.4.7.6 ලංසු ඉදිරිපත් කළ පසු එම ලංසු ඉවත් කර ගැනීමට හෝ වෙනස් කිරීමට අවසර නොලැබේ.

18.4.7.7 වෙන්දේසි වටයක අනුක්‍රමික මිල මත පවතින සමස්ත ඉල්ලුම පවතින සැපයුමට සමාන වන විට හෝ ඊට වඩා පහළට වැටෙන විට වෙන්දේසිකරු විසින් කාලධාරිත වෙන්දේසි අදියර අවසන් කළ යුතුය.

i. අනුක්‍රමික මිල මත ඉල්ලුම අවසන් වටය අවසානයේ සැපයුමට සමාන නම්, පවතින සංඛ්‍යාත වර්ණාවලි කොටස් ඔවුන්ගේ ප්‍රකාශිත ඉල්ලුමට අනුව ලංසුකරුවන් අතර බෙදා හැරිය යුතුය.

ii. අනුක්‍රමික මිල මත ඉල්ලුම සැපයුමට වඩා අඩු වුවහොත්, ලංසුකරුවන්ට ඔවුන්ගේ ප්‍රකාශිත ඉල්ලුමට අනුව සංඛ්‍යාත වර්ණාවලි කොටස් පැවරිය යුතුය.

18.4.7.8 කාලධාරිත වෙන්දේසි අදියර අවසානයේ දී නොවිකුණන සංඛ්‍යාත කොටස් පැවරීම පිණිස, ඉල්ලුම, සැපයුම ඉක්මවන අවසාන අනුක්‍රමික මිලට සමාන වන සංචිත මිලක් සමග, දෙවන මිල නියමය සහිත තනි වට මුද්‍රා තැබූ ලංසු වෙන්දේසියක් භාවිත කළ යුතුය.

19. පැකේජ ලංසු තැබීමේ දී, සංඛ්‍යාත වර්ණාවලිය ලබාදිය හැකි බව සහ සංඛ්‍යාත වර්ණාවලියේ භාවිතය මත පදනම්ව, සමහර වෙන්දේසි වල පැකේජ ලංසු තැබීමට වෙන්දේසිකරු විසින් අවසර දෙනු ලැබේ. වෙන්දේසිකරු විසින් සංඛ්‍යාත වර්ණාවලි කොටස්වල පූර්ව නිශ්චිත පැකේජ ලබා දීම හෝ සංඛ්‍යාත වර්ණාවලි කොටස් සුදුසු අයුරකින් සංයෝජනය කිරීමට අවසරදීම කළ යුතුය.

20. සංඛ්‍යාත වර්ණාවලිය සාධාරණව බෙදා දීම සහතික කිරීම සහ ක්‍රියාකරුවන් එක් අයෙකු හෝ කිහිප දෙනෙකු අතර අනවශ්‍ය ලෙස සංඛ්‍යාත වර්ණාවලිය බෙදීයාම හේතුවෙන් ඇතිවන වෙළඳපල විකෘතිවීම් වැළැක්වීම පිණිස වෙන්දේසිකරු විසින් වෙන්දේසිය සඳහා නියම කළ සංඛ්‍යාත වර්ණාවලි සීමාවන්, සංඛ්‍යාත පැවරුම් නිවේදනයේ සඳහන් අයුරින් නියම කළ යුතුය.

21. කොමිෂන් සභාව විසින් වරින් වර ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු රීති/රෙගුලාසි මත පදනම්ව වෙන්දේසිකරු විසින් සංචිත මිල තීරණය කරනු ලැබේ.

**නිර්වචන :**

| | | |
|---|---|---|
| සංචිත මිල | - | සංචිත මිල ගණන් යන්නෙන් විවිධ සංඛ්‍යාත වර්ණාවලි කොටස් සඳහා ශ්‍රී .ලං.වි.සං.නි.කො. සභාව පිළිගන්නා අවම ලංසුව අදහස් වේ. |
| වෙන්දේසිකරු | - | වෙන්දේසිකරු යන්නෙන් වෙන්දේසිය පැවැත්වීම සඳහා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තකු හෝ කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුවක් අදහස් වේ. |
| විශේෂ සංඛ්‍යාත කොටස් | - | වෙන්දේසියක දී විශේෂ සංඛ්‍යාත කොටසක් වශයෙන් පිරිනැමෙන නිශ්චිත සංඛ්‍යාතයකට සම්බන්ධ සංඛ්‍යාත වර්ණාවලි කොටස් අදහස් වේ . |
| සාමාන්‍ය සංඛ්‍යාත කොටස් | - | වෙන්දේසියක දී නිශ්චිත සංඛ්‍යාතයකට සම්බන්ධ නොවූ සාමාන්‍ය සංඛ්‍යාත කොටස් අදහස් වේ. |
| කොමිෂන් සභාව | - | කොමිෂන් සභාව යන්නෙන් පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ . |
| පැකේජ ලංසු තැබීම | - | ලංසුකරුවන් විසින් සංඛ්‍යාත වර්ණාවලි කොටස්වල පූර්ව නිශ්චිත පැකේජ සඳහා ලංසු ඉදිරිපත් කිරීම හෝ සුදුසු ඕනෑම අයුරකින් සංඛ්‍යාත වර්ණාවලි කොටස් සංයෝජනයට අවසර දීම. |
| ලංසුකරු | - | ලංසුකරුවෙකු වශයෙන් ලියාපදිංචි වූ තැනැත්තෙකි. |
| ලංසු | - | ලංසුව යන්නෙන් තනි සංඛ්‍යාත කොටසක් /පැකේජයක් සඳහා ඉදිරිපත් කරන ලංසුවක් අදහස් වේ. |

EOG 08 - 0180

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.